# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2355/43 - 2023 ඔක්තෝබර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2023.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DS/KU/LND/ACQUS/1/5.
*සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/14/2020/ CEB/82.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹුරුපිට්ටි දකුණ ග්‍රාම සේවා වසමේ සර්වේයර් ජනරාල් විසින් 2023.07.17 දිනැතිව පිළියෙල කරන ලද CM 260225 දරන පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0334 පමණ වූ කැබැලි අංක 01 යන ඉඩමට මායිම් විස්තර පහත සඳහන් කර ඇත.

**කැබලි අංක 01 - ප්‍රමාණය: හෙක්. 0.0334.**

*උතුරට*: මාර්ගය (PS); *නැගෙනහිරට*: කුඹුරුපිට්ටි දකුණ ගම්මානයේ කොටසක් (TP 346434); දකුණට: කුඹුරුපිට්ටි දකුණ ගම්මානයේ කොටසක් (TP 346434); බටහිරට: කුඹුරුපිට්ටි දකුණ ගම්මානයේ කොටසක් (TP 346434).

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 නොවැම්බර් මස 21 වැනි දින පෙ.ව. 10.00 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.11.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කේ. කුණනාදන්,**
ප්‍රාදේශීය ලේකම්,
කුච්චවෙලි.

2023 ඔක්තෝබර් මස 05 වැනි දින,
කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0277